# කෘෂිකර්ම අමාත්‍යාංශයේ පිළිගැනීමේ නිලධාරී තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමේ පරිපාටිය

01 සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : කෘෂිකර්ම අමාත්‍යාංශය යොමු අංකය :2/1/1/2/ පිළිගැනීමේ නිලධාරී දිනය: 2014.09.25

1.2 අමාත්‍යාංශය : කෘෂිකර්ම අමාත්‍යාංශය යොමු අංකය :2/1/1/2/ පිළිගැනීමේ නිලධාරී දිනය: 2014.09.25

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින්

තනතුරු අනුමත කිරීම : යොමු අංකය: DMS/0012 දිනය: 2014.09.25

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ

නිර්දේශය : යොමු අංකය: EST – 3/RECRU/03/3259 දිනය: 2015.01.28

1.5 ජාතික වැටුප් කොමිෂන් සභාවේ

නිර්දේශය : යොමු අංකය: NPC/5/42/SR-1-II දිනය: 2014.12.17

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය :

යොමු අංකය: PSC/EST/02-01-11/01/2015 දිනය: 2015.05.19

## 02.පත් කිරීම් බලධරයා :

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද, කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්

## 03. සේවා ගණයට පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය :

ආයතනයට පැමිණෙන අමුත්තන් ආචාරශීලීව පිළිගැනීම අදාල අංශ වෙත යොමු කිරීම හා ආයතනයෙන් සේවාවන් ලබා ගැනීම සඳහා පැමිණෙන පුද්ගලයින් නිවැරදි මාර්ගෝපදේශකත්වය යටතේ අදාල අංශ වෙත යොමුවීම සඳහා නිවැරදි තොරතුරු සැපයීම මෙන්ම ආයතන ප්‍රධානියා විසින් නිශ්චිත කොට පවරා දෙනු ලබන කාර්යයන් මෙම තනතුර දරන්නා විසින් ඉටු කරනු ලැබිය යුතුය.

## 04. තනතුරේ ස්වභාවය :

මෙම තනතුර කොන්ත්‍රාත් පදනම මත ඇති කළ තනතුරක් වන අතර, ස්ථිර පත්වීමක් ලබා ගැනීමට හෝ ස්ථිර නිලධාරීන්ට හිමි වරප්‍රසාද සඳහා හෝ හිමිකම් නොමැති තනතුරකි. මෙම තනතුර සඳහා බඳවා ගනු ලබන්නේ එක් වර්ෂයක කොන්ත්‍රාත් කාලයක් සඳහා පමණි. වාර්ෂිකව අමාත්‍යාංශයේ ලේකම් විසින් කොන්ත්‍රාත් කාලය නැවත දීර්ඝ කිරීම කාර්ය සාධන ඇගයීමෙන් අනතුරුව සිදු කරනු ලැබේ.

05. වැටුප් : මාසිකව රු.15,745/= ක් හා පවතින ජීවන වියදම් දීමනාව හිමි වේ.

## 06. සේවා ගණයට අයත් තනතුර / තනතුරු

6.1 කොන්ත්‍රාත් පදනම යටතේ බඳවා ගැනීමට අනුමත තනතුරු නාම, තනතුරු සංඛ්‍යාව හා ඊවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව | පැවරෙන කාර්යයන් |
|---|---|---|
| පිළිගැනීමේ නිලධාරී | 01 | අමාත්‍යාංශය වෙත පැමිණෙන අමුත්තන් ආචාරශීලීව පිළිගෙන නිවැරදි මාර්ගෝපදේශකත්වයක් යටතේ අදාළ අංශ සඳහා යොමු කිරීම හා ඔවුන් වෙත මිත්‍රශීලී තාක්ෂණික සේවයක් ලබාදීම හා කාෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් විසින් පවරන අනෙකුත් කාර්යයන් |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : 01

## 07. කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමේ සුදුසුකම්

7.1 අධ්‍යාපන සුදුසුකම් :

(අ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය සහ සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් 04 කට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී විෂයයන් 06 ක් සමත්ව තිබීම.

(ආ)අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් එක් විෂයකින් හෝ (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

7.2 වෘත්තීය සුදුසුකම් :

තනතුරට අදාල ක්ෂේත්‍රයේ ලබා ඇති වෘත්තීය සුදුසුකම් විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

7.3 පළපුරුද්ද :

රජයේ හෝ පෞද්ගලික ආයතනයක පිළිගැනීමේ නිලධාරීනියක් වශයෙන් මාස 06ක් හෝ ඊට වඩා වැඩි කාලයක් සේවය කර තිබීම.

7.4 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

7.5 වෙනත් සුදුසුකම් :

I. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය
II. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.1 සිට 7.5 දක්වා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ ගැසට් නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතිකවල පිටපත් අයදුම් පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතු ය.

08 වයස :

8.1 අවම සීමාව : අවුරුදු 18 ට නොඅඩු

8.2 උපරිම සීමාව : අවුරුදු 30 ට නොවැඩි

09 බඳවා ගැනීමේ ක්‍රමය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් බඳවා ගනු ලැබේ. ව්‍යුහගත පරීක්ෂණයේදී සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

9.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| | ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 25 | අදාළ නොවේ |
| 02 | භාෂා ප්‍රවීණතාවය | 25 | |
| 03 | පරිගණක දැනුම | 15 | |
| 04 | අතිරේක පළපුරුද්ද | 30 | |
| 05 | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | 05 | |
| | එකතුව | 100 | |

සටහන : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙහි මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව උපරිම ලකුණු ලබා ගන්නා අයදුම්කරු තනතුරට බඳවා ගනු ලැබේ.

9.1.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා : කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්

9.2 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :
රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළකිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළකිරීම මඟින් අයදුම්පත් කැඳවනු ලැබේ.

10. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නාවූ කොන්දේසි : අදාළ නොවේ.

11. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපණ : අදාළ නොවේ.

12. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

13. මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වේනොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

සකස් කළේ: අත්සන: ........................

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම :

තනතුර :

ආර්. සී. [illegible]
සහකාර ලේකම් [illegible]
කෘෂිකර්ම අමාත්‍යාංශය
"ගොවිජන මන්දිරය"
80/5, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

දිනය : 2015.06.05

පරීක්ෂා කළේ: අත්සන: ........................

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම :

තනතුර :

ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
කෘෂිකර්ම අමාත්‍යාංශය
"ගොවිජන මන්දිරය"
80/5, රජමල්වත්ත පටුමග
බත්තරමුල්ල.

දිනය : 2015.06.05

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ........................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

එන්. පී. වී. සී. පියතිලක
අතිරේක ලේකම් (පාලන හා මුදල් I)
කෘෂිකර්ම අමාත්‍යාංශය
"ගොවිජන මන්දිරය"
80/5, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

නම : ........................

තනතුර : ........................

දිනය : 23/6/2015

නිලමුද්‍රාව: ........................

---

යොමු අංකය: 2/1/1/2/MN- 01

කෘෂිකර්ම අමාත්‍යාංශයෙහි පිළිගැනීමේ නිලධාරී තනතුර සඳහා යෝජිත කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන: ........................

නම: බී. විජයරත්න
ලේකම්
කෘෂිකර්ම අමාත්‍යාංශය
"ගොවිජන මන්දිරය", 80/5,
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය

දිනය: 08/07/2015

නිල මුද්‍රාව : ........................

---

යොමු අංකය: PSC/EST/02-03-11/01/2015

කෘෂිකර්ම අමාත්‍යාංශයෙහි පිළිගැනීමේ නිලධාරී තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමේ පරිපාටිය 2015-07-19 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන: ........................

නම: ........................

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය: 23/07/2015

නිල මුද්‍රාව : ........................

ඒ. එම්. එල්. සී. යෝනාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ 05